ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින් මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් මහජනයා වෙත ලබා දෙන සේවාවන් සඳහා එක් එක් ආදායම් සංකේත යටතේ දෛනිකව ලැබිය යුතු ආදායම නිවැරදිව එකතු වන බව තහවුරු කර ගැනීමකින් තොරව හා ලබා දෙන සේවාවන් අනුව ලැබිය යුතු ආදායම හා ලද ආදායම සැසඳීම මඟින් වසරේ ආදායම නිවැරදි බව තහවුරු කර ගැනිමකින් තොරව, බැංකුව විසින් දෛනිකව එවනු ලබන ආදායම් වාර්තා සහ බැංකු ප්‍රකාශන පමණක් පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස රු.12,974,594,203 ක් ගිණුම් ගත කර තිබුණි.	දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක පරිගණක පද්ධතියේ දෛනික ආදායම් වාර්තාව පදනම් කරගෙන වාර්ෂික ආදායම ගිණුම්ගත කරනු ලබන අතර පරිගණක පද්ධතියේ නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා දෛනිකව බැංකුගත කරන මුදල හා පරිගණක දෛනික වාර්තාව සංසන්දනය කිරීම සිදු කරනු ලබයි. එසේම දිස්ත්‍රික් කාර්යාලවල බැංකු ගත කරන මුදල් පිළිබඳ දිනපතා WhatsApp සමූහයක් මගින් තොරතුරු ලබාගන්නා අතර, එම ආදායම බැංකු ගිණුම් ප්‍රකාශය හා භාණ්ඩාගාරය මගින් මාසිකව පවරා ගන්නා ලද මුදල් ප්‍රවාහය පිළිබඳ වාර්තාව සමඟ සංසන්දනය කර ආදායම තහවුරුකර ගැනීම සිදු කරනු ලබයි.	දෙපාර්තමේන්තුව සැපයූ සේවාවන් අනුව ලැබිය යුතු ආදායම හා ලද ආදායම දෛනිකව සැසඳීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තු ආදායම් සංකේත 04ක් යටතේ රු.7,148,201ක් නිසි අනුමැතියකින් තොරව ආදායමින් ආපසු ගෙවා තිබූ අතර, ඉන් රු.6,694,751ක ආදායමින් ආපසු ගෙවීම් සිදු කිරීමට හේතු වූ කරුණු තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි.	තැපැල් දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල 12 මගින් වරින්වර ආදායමට හර කර ඇති අතර එම හර කිරීම් වැරදි නිවැරදි කිරීම් සඳහා 2020.08.28 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 1/2020-1 කොටස 4 ඡේදය මුදල් රෙගුලාසි 118 - ඒකාබද්ධ අරමුදලට බැර කෙරුණු රාජ්‍ය ආදායම ආපසු ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශයේ මුදල් රෙගුලාසි 460 යටතේ යොදන ලද ජර්නල් සටහන් හේතුවෙන් ඇති වූවකි.	වැරදි නිවැරදි කිරීම් හෝ වෙනත් අඩු කිරීම් සඳහා සිදුකර ඇති ජ'නල් සටහන්, ඊට අදාල බලයලත් නිලධාරීන්ගේ අනුමැතීන් හා උපයෝගී ලේඛන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් ගෙන්වා ගෙන මාසික ගිණුම් සාරාංශ සමග සසැඳීම් සිදු කළ යුතුය.
(ඇ)	දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන හිඟ බදු සම්බන්ධ උපලේඛන මගින් අදාල මෝටර් රථ ලියාපදිංචි කළ දිනය, ඉදිරියට ගෙවීමට ඇති බදු ප්‍රමාණය හා වර්ෂ ගණන, බදු හිඟ වී ඇති වර්ෂ ගණන ආදී තොරතුරු ඇතුළත්ව එක් එක් වාහනයට	1003-01-00 දරන ආදායම් ශීර්ෂය සුඛෝපභෝගී මෝටර් රථ බද්ද වන අතර, ඒ යටතේ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී, අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය බදු රැස් කරනු ලබයි. ඒ සඳහා වාර්ෂිකව ආදායම් ඇස්තමේන්තු සකසන ලද අතර, හිඟ ආදායම් වාර්තාද 1003-01-00 ආදායම් ශීර්ෂයට	එක් එක් වාහනයෙන් එක් වර්ෂය සඳහා අයවිය යුතු හිඟ සුපෝඛභෝගි බද්ද වෙන්වෙන්ව හඳුනාගත හැකිවන පරිදි හිඟ ආදායම් බදු වාර්තා පවත්වාගෙන යා යුතුය.

අදාළව හිඟ බදු සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු.130,546,000 ක හිඟ සුබෝභෝගී බදු ආදායමේ නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.	අදාළව පිළියෙල කර ඇත.	

1.6.2 මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය තුළ වේරහැර කාර්යාලය වෙනුවෙන් දරා තිබුණු රු.1,198,815,516 ක පුනරාවර්තන වියදම්, 307-2-1-1-2509 යන ප්‍රාග්ධන වැය විෂය යටතේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	වේරහැර කාර්යාලය වෙනුවෙන් දරා තිබුණු 307-2-1-1-2509 ප්‍රාග්ධන වැය විෂය යටතේ ගිණුම් ගත කර ඇත්තේ රියදුරු බලපත්‍ර මුද්‍රණයට අදාල සියළු වියදම් එක පිරිවැය මධ්‍යස්ථානයත් ලෙස සලකා පිරිවැය හඳුනා ගැනීමේ පහසුව වෙනුවෙනි. නමුත් ඉදිරියේදී 2026 වර්ෂය වෙනුවෙන් අයවැය සකස් කිරීමේදී වේරහැර කාර්යාලය වෙනුවෙන් දරනු ලබන පුනරාවර්ථන වියදම් වෙන වෙනම ඇස්තමේන්තු ගත කර පුනරාවර්තන වැය විෂයන් යටතේ වියදම් දැරීමට කටයුතු කරමි.	අයහාර වියදම් මූලධන ප්‍රතිපාදන මඟින් නොදැරිය යුතුය.

1.6.3 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂයට වර්ෂය අවසානයේ වූ අග්‍රිම ශේෂය එකතු කළ විට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂයට සමාන විය යුතු නමුත් රු.2,240,100ක වෙනසක් ඇති වී තිබුණි.	2024/12/31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය සහ අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය අතර වෙනසට හේතු වී ඇත්තේ දෙපාර්තමේන්තු පොත්වල ගිණුම්ගත කිරිමට නොහැකි වී තිබූ ආදායමකි. එය 2025/03/28 දින ජ'ර්නල් අංක 25/006 මගින් නිවැරදි කර ඇත.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.

1.6.4 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මීගහකිවුල ගොඩනැගිලි ඉදිකිරීම් හා ස්පර්ශක ක්‍රමයේ විභාග සිදු කිරීම (307-2-1-10-2104) සහ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (307-2-1-1-2102) යන වැය විෂයයන් තුළින් වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ 11 ක ශීර්ෂයන් යටතේ සමාලෝචිත වර්ෂය තුළ රු.41,138,080ක ප්‍රාග්ධන වියදම් දරා ඇති නමුත් මිලදී ගත් එකී වත්කම් ගිණුම් ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2024 වර්ෂයට අදාළව 307-2-1-10-2104 යන වැය විෂය මගින් දිස්ත්‍රික් කාර්යාල වියදම් දරා ඇත්තේ දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් සහ වැඩි දියුණු කිරීම් වෙනුවෙනි. එවැනි වියදම් මගින් වත්කම් නිර්මාණය වීමක් සිදු නොවන හෙයින් වත්කම් ලෙස ගිණුම්ගත නොකරන ලදී. ඉදිරියේදී 2026 වර්ෂයට අදාලව මෙවැනි වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන ගොඩනැගිලි අළුත්වැඩියා සහ වැඩිදියුණු කිරීම් (2001) යන වැය විෂය යටතේ ඇස්තමේන්තු ගත කර වියදම් දැරීමට කටයුතු කරමි. 307-2-1-1-2102 වැය ශීර්ෂයෙන් කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය වෙත අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු.60,000 ක ප්‍රතිපාදන ලබා දුන් අතර, එය ඉන්වෙන්ට්‍රි ගත නොවී ඇති බැවින් මෙම වසරේදී ප්‍රධාන කාර්යාලයේ වත්කම්වලට ඇතුළත් කිරීමට කටයුතු කරමි.	මූලධන වියදම අදාල කර ගන්නා වැය ශීර්ෂය මඟින් වත්කම ගිණුම්ගත කළ යුතුය.

1.6.5 මූල්‍ය වත්කම්

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදයේ මුදල් රෙගුලාසි 113(6)(ආ) යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශ අංක 01 මගින්, ස්ථාන මාරු වීම්, මියයෑම්, විශ්‍රාම යෑම්, වැඩ තහනම් කිරීම්, විදේශ ගතවීම්, සේවය අත්හැර	මු.රෙ.113(6)(ආ) යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශ අංක 01 මගින් විවිධ හේතූන් මත කල්ගත වූ ණය ශේෂ අයකර ගැනිම සම්බන්ධයෙන් අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග අනුව කටයුතු කරමින් ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශය මගින් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත 2024.08.12 දිනද, 2024.10.25 දින ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යංශය වෙතද යොමු කර ඇත. නමුත්	කල් ගත වූ ණය ශේෂ සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

යැම් වැනි හේතුන් මත කල්ගත වූ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග දක්වා ඇනත්, වසර 05 ට වඩා කල්ගත වූ එවැනි රු.1,673,874 ක ණය ශේෂ සම්බන්ධයෙන් උක්ත විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.	2024.11.11 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව මගින්ද 2024.11.19 දින ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මගින්ද අප විසින් පෙන්වා වසර 10ක තොරතුරු පමණක් ණය අයකර ගැනීමට ගන්නා ලද ප්‍රමාණවත් ක්‍රියාමර්ග ලෙස සාධාරණීකරණය කළ නොහැකි බව දන්වා ඇත.	

1.6.6 ශුද්ධ වත්කම්/ස්කන්ධය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.9 ඡේදය අනුව අත්තිකාරම් ගිණුම්වල වටිනාකමින් තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කළ පසු ශුද්ධ වත්කම් ගණනය රු.123,271,821 ක් විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (ACA-P) තුළ ශුද්ධ වත්කම් රු.121,723,524 ක් ලෙස ඇතුළත් කර තිබුණි.	සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් රු.123,271,821ක් විය යුතු වුවත් එය රු.121,723,524ක් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වාර්තා කර තිබූ අතර වෙනස රු.1,548,297 ක් විය. මෙම වෙනසට හේතුව රු.1,548,297ක නොපියවූ අග්‍රිම ශේෂයක් පැවතීමයි. එම ශේෂයෙන් රු.1,529,147ක ප්‍රමාණය මේ වන විට නිවැරදි කර ඇත. තවදුරටත් රු.19,150ක මැතිවරණ අත්තිකාරම් ශේෂයක් ඉතිරිව ඇති අතර එය කඩිනමින් මැතිවරණ කාර්යාලයෙන් ලබාගෙන නිවැරදි කරමි.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් ගණනය කර වාර්තා කළ යුතුය.

1.6.7 අග්‍රිම ශේෂය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු.638,247ක් වූ අතර, දෙපාර්තමේන්තු පොත් අනුව එම ශේෂය රු.1,548,297ක් විය. මේ හේතුවෙන් අග්‍රිම ගිණුම් ශේෂ දෙක අතර රු.910,050ක පැහැදිලි නොකළ වෙනසක් නිර්මාණය වී තිබුණි.	නොපියවූ මැතිවරණ අත්තිකාරම් ශේෂයක් පැවති අතර එම ශේෂයෙන් රු.1,529,197ක ප්‍රමාණය මේ වන විට නිවැරදි කර ඇත. තවදුරටත් රු.19,150ක මැතිවරණ අත්තිකාරම් ශේෂයක් ඉතිරිව ඇති අතර එය කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරමි.	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව අග්‍රිම ශේෂයක් නොපවතින ලෙසට කටයුතු කිරීමට වගබලා ගත යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ රු.638,247ක ශේෂය, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි අග්‍රිම ශේෂය ලෙස දක්වා නොතිබුණි.	අග්‍රිම ගිණුමේ ශේෂයක් පැවතියද එම අඩුපාඩු නොසලකා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය නිවැරදිව සකස් කර තිබීම හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂයක් නොපෙන්වයි.	මූල්‍ය ප්‍රකාශනවල එක් එක් ආකෘතිපත්‍ර මගින් තොරතුරු වාර්තා කිරීමේදී 2024 දෙසැම්බර් 31 දිනට පවතින සත්‍ය තොරතුරු අනාවරණය කළ යුතුය.

1.6.8 අස්ථානගත වවුචර්පත්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 272(1) සහ 545(4) අනුව ගෙවීම් කරන ලද සියලු වවුචර්පත් අංක පිළිවෙලට සකස් කර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එකතුව රු.3,129,422ක ගෙවා නිදහස් කරන ලද වවුචර්පත් 16ක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු අතර, නියැදි පරීක්ෂාවට ලක්වූ එකතුව රු.104,057 ක වවුචර්පත් 03කට අදාලව වවුචරය සහ සහයෝගී ලේඛනවල මුල් පිටපත වෙනුවට ඡායා පිටපත් ඉදිරිපත් කර තිබුණි.	වවුචර්පත් 07 ක් වෙරහැර කාර්යාලයෙන් ලැබිය යුතුව ඇත. එම වවුචර්පත් ගෙන්වාගෙන වවුචර් ගොනු සම්පූර්ණ කිරීමට කටයුතු කරමි.	2024 දෙසැම්බර් 31 දිනට විගණනය වෙත ඉදිරිපත් නොවූ මෙම වවුචර් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.

1.6.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 447 ප්‍රකාරව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය යාවත්කාලින කර නොතිබුණි.	දෙපාර්තමේන්තු විසර්ජන වැය ලෙජරය පවත්වාගෙන ගියද එය නිවැරදිව යාවත්කාලීන වී නොතිබුනු අතර, මෙම වසරේදී එය නිවැරදිව යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කරමි.	මුදල් රෙගුලාසි 447 හි සඳහන් විධිවිධාන ඇතුළත් වන පරිදි 138 වැනි පොදු පෝරමය අනුව දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පුනරාවර්තන වැය විෂයයන් 10ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා ගෙන තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනයෙන් පසු රු.1,410,332,471ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. උක්ත ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 19 සිට සියයට 100 දක්වා වූ	වියදම් පාලන චක්‍රලේඛ ප්‍රකාරව පුනරාවර්ථන වියදම් අරපිරිමැස්මෙන් වියදම් කිරීම නිසා මෙලෙස ප්‍රතිපාදන ඉතිරිවීම සිදුවිය. නමුත් 307-2-1-1-1409 වැය ශීර්ෂය නව ලියාපදිංචි වාහන අංක තහඩු වියදම් 2024.04.30 පැවති කොන්ත්‍රාත් ගිවිසුමේ කාලය අවසන් වීම	නිවැරදි පුරෝකථනයන් සහිතව අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතුය.

	පරාසයන් ගෙන තිබුණි.	හේතුවෙන් එම වර්ෂයේ ඉතිරි කාල සඳහා ගෙවීම් කටයුතු සිදු නොවීම නිසා එම වැය ශීර්ෂයේ ප්‍රතිපාදන ඉතුරුවිය. 307-2-1-12-1409 විද්‍යුත් රථවාහන ශීර්ෂයේ එම ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම හේතුවෙන් එම දත්ත පද්ධතිය සඳහා වෙන්කල ප්‍රතිපාදන සියල්ල ඉතුරුවිය. ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරමි.	
(ආ)	මූලධන වැය විෂයන් සඳහා නිවැරදි පුරෝකතනයකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 04කට අදාළව ප්‍රතිපාදන උපයෝජනයෙන් පසු රු.24,382,409ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එකී ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 14 සිට සියයට 76 වූ පරාසයක් ගෙන තිබුණි.	මූලධන වැය විෂය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර ගැනීම් සිදුකළද එම ප්‍රාග්ධන ව්‍යාපෘති සිදු නොවීම හේතුවෙන් ඊට අදාල ගෙවීම් සිදු නොවීම මත මෙලෙස ප්‍රතිපාදන ඉතිරි විය.	නිවැරදි පුරෝකථනයන් සහිතව අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	නව ලියාපදිංචි වාහන අංක තහඩු (01-1409) වැය විෂය සඳහා අධි ප්‍රතිපාදන සලසා ගැනීම හා පුනරාවර්තන වැය විෂයන් 10කට සහ මූලධන වැය විෂයන් 03කට අදාලව වියදම් නිසි ලෙස පුරෝකථනය නොකිරීම හේතුවෙන් වාහන අංක තහඩු වැය විෂයයෙන් රු.216,400,000ක් උක්ත වැය විෂයන් 13 වෙත මුදල් රෙගුලාසි 66/69 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කිරීමට සිදු වී තිබුණි.	නව ලියාපදිංචි වාහන අංක තහඩු (01-1409) වැය විෂය සඳහා ප්‍රතිපාදන සළසාගෙන තිබුණද 2024 වර්ෂයේ වාහන අංක තහඩු සකස් කිරීම තාවකාලිකව නැවැත්වීමට සිදුවීම නිසා එම වැය ශීර්ෂයේ ප්‍රතිපාදන ඉතුරුවිය. එම නිසා එම ඉතිරි ප්‍රතිපාදන මු.රෙ.66/69 ප්‍රකාරව මාරු කරන ලදී.	නිවැරදි පුරෝකථනයන් සහිතව අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	පුනරාවර්තන වැය විෂය අංක 12-1409 යටතේ විද්‍යුත් රථ වාහන දත්ත පද්ධතියක් (ඊ-මෝටරින්) සංවර්ධනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.833,600,000ක ප්‍රතිපාදන සලසා දී ඇතත් එකී ප්‍රතිපාදනවලින් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි.	විද්‍යුත් රථවාහන දත්ත පද්ධතියක් (ඊ මෝටරින්) සඳහා 12-1409 වැය විෂය යටතේ ප්‍රතිපාදන සළසා තිබුනද එම දත්ත පද්ධතිය සංවර්ධනය කිරිමේ කටයුතු නැවතී ඇති බැවින් එම ප්‍රතිපාදන භාවිතා නොවිය.	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු අනුමැතීන් ලැබී ඇත්නම් පමණක් ප්‍රතිපාදන සලසා ගත යුතුය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2025 ජනවාරි මාසය තුළ ගෙවා නිදහස් කර තිබූ එකතුව රු.465,936ක් වූ පූර්ව වර්ෂයට අදාල වියදම්, 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි.	2025 ජනවාරි මස ගෙවා තිබූ රු.465,936 ක්වූ අතපසු වීමකින් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් තුළ ඇතුළත් නොවීය. ඉදිරියේදී එවැනි වැරදි සිදු නොවීමට උපදෙස් ලබාදෙන ලදී.	ඉදිරි වර්ෂය තුළ ගෙවීමට ඇති බැරකම් සියල්ල හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුය.
(ආ)	විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ප්‍රකාශයේ දක්වා තිබූ බැරකම් වටිනාකම හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල (SA-92) සමුච්චිත බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ බැරකම් වටිනාකම අතර රු.58,172,711ක වෙනසක් ඇති වී තිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට බැරකම්වල එකතුව රු.78,536,934 ක් වුවද, එය භාණ්ඩාගාර සමුච්චිත බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාවෙහි සඳහන් අංකයට වඩා වෙනස් වී ඇත. එවැනි වැරදි ඉදිරියේදී සිදු නොවීමට කටයුතු කරමි.	බැඳීම් හා බැරකම්වල නිවැරදි අගයන් SA 92 ආකෘතියේ ඇතුළත් කළ යුතුය.
(ඇ)	මුදල් රෙගුලාසි 94 සහ 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා වියදම් සඳහා බැඳීම් ඇති කර ගත නොහැකි වුවද, සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂයන් 03ක් යටතේ ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.48,712,408ක බැඳීම් ඇති කර ගෙන තිබුණි.	මුදල් රෙගුලාසි 94(2) පරිදි වේරහැර කාර්යාලය සඳහා එන වියදම් හා වාහන නඩත්තු වියදම් ඊළග මුදල් වර්ෂයේදී වියදම් අපේක්ෂාවෙන් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳී ඇත.	මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වර්ෂයේ දෙපාර්තමේන්තු මුදල් ප්‍රතිපාදන ඉක්මවා වියදම් සඳහා බැඳීම් ඇති කර නොගත යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා භාවිතා වන SRITIS පරිගණක මෘදුකාංගය වෙනුවෙන් නඩත්තු හා සේවා ලබා ගැනීම**		
	නිර්මාණය කිරීම, මෙහෙයුම් කටයුතු සිදුකිරීම හා භාරදීම (BOT) සංකල්පය යටතේ මිලදීගෙන ඇති SRITIS පරිගණක මෘදුකාංගය 2020 වර්ෂයේදී එහි මූලාශ්‍ර කේතයන් සමග මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබුණි. 2021 හා 2022 වර්ෂයන්හිදී මෙම මෘදුකාංගය සඳහා නඩත්තු සේවා	රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා වූ SRITIS පද්ධතිය 2009 වර්ෂයේ විවෘත ප්‍රසම්පාදනයක් සිදු කර Face Technologies සහ Metropolitan සන්දීය සමාගම වෙත 2009 වර්ෂයේ සිට වසර හතක් සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. එම ගිවිසුම් කාලය අවසානයේ අවස්ථා 05ක අමාත්‍ය මණ්ඩල අනුමැතින් මත කොන්ත්‍රාත්	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන සහ ප්‍රසම්පාදනයේ අරමුණු ඉටු කරගත හැකි අයුරින් තරඟකාරී මිල

ලබාගත් ආකාරය සම්බන්ධ ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් නොවුණු අතර, 2023 හා 2024 වර්ෂයන් සඳහා නිසි ටෙන්ඩර් පටිපාටියකින් තොරව පිළිවෙලින් රු.154,100,000 ක හා රු.181,973,700 ක මුදලකට පෞද්ගලික සමාගමකින් නඩත්තු හා සේවා ලබාගෙන තිබුණි. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන ලියාපදිංචිය හා පැවරීම සඳහා වන දත්ත පද්ධතිය හා සැසඳීමේදී මෙම දත්ත පද්ධතිය ඉතා සරල දත්ත පද්ධතියක් වීමත්, වාහන ලියාපදිංචි දත්ත පද්ධතියේ නඩත්තු හා සේවා පිරිවැය රු.10,000,000ක් වීමත් සැලකිල්ලට ගත් කළ, රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ දත්ත පද්ධතියේ නඩත්තු හා සේවා සඳහා ඉතා අසාමාන්‍ය පිරිවැයක් දරා ඇති බව නිරීක්ෂණය විය. කෙසේ නමුත් ටෙන්ඩර් ක්‍රියාවලියකින් තොරව මෘදුකාංගයේ නිර්මාණකරුවන් සමග කිසිදු සම්බන්ධතාවයක් නොමැති ආයතනයක් වෙත ඉතා ඉහළ පිරිවැයකට මෘදුකාංගයේ නඩත්තු හා සේවා ලබාදීමට හේතු වූ කරුණු කිසිවක් ලේඛනගත වී නොතිබුණි.

කාලය 2016 සිට 2020 දක්වා දීර්ඝ කිරීමට කටයුතු කර ඇත.

කෙසේ වුවද අංක 19/3524/225/011 හා 2020/01/08 දිනැති කැබිනට් තීරණය මත රියදුරු බලපත්‍ර පද්ධතියේ වත්කම් දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට කටයුතු කර ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2021/07/01 දින සිට සේවා සැපයුම්කරු සමග රියදුරු බලපත්‍ර පද්ධතිය සඳහා සවිස්තරාත්මක මෙහෙයුම්, සේවා හා නඩත්තු ගිවිසුමකට එළඹ ඇත.

අංක 20/0691/225/024 හා 2020/04/22 දිනැති හා 2020/07/01 දිනැති කැබිනට් තීරණය අනුව රියදුරු බලපත්‍ර දත්ත පද්ධතිය ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත පවරා ගෙන ඇති අතර එම 2021/01/01 සිට 2023/09/12 දක්වා කාලය තුළ (Face Technologies සහ Metropolitan සන්ධීය සමාගම වන) මෙට්‍රොපොලිටන් ඇඩ්වාන්ස් ටෙක්නොලොජීස් පුද්ගලික සමාගම සමඟ උක්ත මෙහෙයුම්, සේවා හා නඩත්තු ගිවිසුම යටතේ (එක් වර්ෂයක් සඳහා රු.මිලියන 154 ක) යුධ හමුදාව විසින් රියදුරු බලපත්‍ර පද්ධති මෙහෙයුම් කටයුතු සිදු කර ඇත. 2023/09/13 දින සිට ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් නැවත රියදුරු බලපත්‍ර දත්ත පද්ධතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුව යථෝක්ත ගිවිසුම යටතේ සාකච්ඡා කර එම මිලටම පසුපෙළ පද්ධති මෙහෙයුම්ද (Backend Service) සමග 2024 වර්ෂය සඳහා සේවා ලබා ගැනීම සිදු කර ඇත.

ගණන් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ) රියදුරු බලපත්‍ර මුද්‍රණයට භාවිතා කෙරෙන මුද්‍රණ යන්ත්‍ර වල සේවා හා නඩත්තුව සඳහා ගිවිසුම් ගත වීම

රියැදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා භාවිතා කෙරෙන 2017 වර්ෂයේ දී මිලදීගෙන ඇති මුද්‍රණ යන්ත්‍ර 02 ක් සේවා හා නඩත්තුව සඳහා කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව රු.14,700,000කට පෞද්ගලික සමාගමක් සමග සේවා ගිවිසුමක් ඇති කරගෙන තිබුණි. මෙවැනි නව මුද්‍රණ යන්ත්‍රයක වෙළඳපොළ මිල රු.මිලියන 15ත් 20ත් අතර පැවතීමත්, මෙම මුද්‍රණ යන්ත්‍ර 02 හි වෙළඳපොළ වටිනාකම

දෙපාර්තමේන්තුව සතුව පවතින මුද්‍රණ යන්ත්‍ර සීමාසහිත වීම හේතුවෙන් 2017 වර්ෂයේ මිලදී ගත් මුද්‍රණ යන්ත්‍ර අඛණ්ඩව භාවිතා කිරීමේදී නඩත්තු හා සේවා කටයුතු වෙනුවෙන් වැඩි මිලක් ගෙවීමට සිදුවෙයි.

2021 වර්ෂයේ යුධ හමුදාව යන්ත්‍ර 09ක් මිලදී ගැනීමට සැලසුම් කළද එක් යන්ත්‍රයක් පමණක් මිලදීගෙන තිබුණි.

ඉන්පසුව 2002 වර්ෂයේ යන්ත්‍ර 06ක් මිලදී ගැනීමට නැවත ප්‍රසම්පාදන කටයුතු සිදුකළද

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන සහ ප්‍රසම්පාදනයේ අරමුණු ඉටු කරගත හැකි අයුරින් තරඟකාරී මිල ගණන් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියකින්

	නඩත්තු පිරිවැයට වඩා අඩු විය හැකිවීමත් හේතුවෙන්, මුදලට අගය සංකල්පයෙන් බැහැරව රාජ්‍ය මුදල් වැය කර තිබූ මෙම සේවා ගිවිසුම මතභේදාත්මක වී තිබුණි.	අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කළ අවස්ථාවේදී ප්‍රතිපාදන ලබාදිය නොහැකි බවත්, දැනට කුළී පදනම පත සේවා සපයා ගන්නා ලෙස දන්වා තිබුණි. මේ වන විට නව මුද්‍රණ යන්ත්‍ර 02ක් මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර අදාළ කටයුතු සිදුකරමින් පවතී.	භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**රියදුරු බලපත්‍ර මුද්‍රණය පෞද්ගලික සමාගමක් වෙත පැවරීම**		
	වේරහැර රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2022 වර්ෂයේ දි රු.311 කට රියදුරු බලපත්‍ර කාඩ් පතක් මිලදි ගෙන තිබියදී කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව එක් පෞද්ගලික සමාගමකින් පමණක් මිල ගණන් කැඳවා එක් කාඩ්පතකට රු.576ක් ගෙවීමට හා මුද්‍රණ පිරිවැය ගෙවීමට ගිවිසුමගත වීම හේතුවෙන් 2023 සැප්තැම්බර් 15 දින සිට 2024 ජූලි මාසය දක්වා මුද්‍රණය කළ කාඩ්පත් 507,807ක් සඳහා එක් කාඩ්පතකට රු.265ක් (රු.576 - රු.311) වැඩිපුර ගෙවීමට සිදුවීම හේතුවෙන් රු.134,568,855ක් රජයට පාඩු සිදුකර තිබුණි.	එවකට රටේ පැවැති ආනයන සීමා කිරීම් හා පැවති ආර්ථික අර්බුදය හමුවේත් මුද්‍රණය කිරීමට එකතුවී තිබූ පසුබැසි රියදුරු බලපත්‍ර ප්‍රමාණය සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගොස් තිබූ නිසාත් රියදුරු බලපත්‍ර කඩිනමින් මහජනතාව වෙත නිකුත් කිරීමේ රජයේ අවශ්‍යතාවය හේතුවෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක අමප/24/2115/809/005 මගින් පෞද්ගලික සමාගමක් වෙත රියදුරු බලපත්‍ර කාඩ්පත් මුද්‍රණය සඳහා අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හා ගිවිසුමෙහි සඳහන් මිල ගණන් අනුව අදාල සමාගම විසින් කාඩ්පත් සපයා මුද්‍රණය කරන ලද කාඩ්පත් වෙනුවෙන් වූ ගෙවීම් පමණක් සිදු කර ඇත. (මුද්‍රණය කර ඇති කාඩ්පත්‍ර සංඛ්‍යාව කොමසාරිස් (රියදුරු බලපත්‍ර) හා නියෝජ්‍ය කොමසාරිස් (රියදුරු බලපත්‍ර) මගින් සහතික කර ඇත.	රජයට අලාභයන් සිදු කළ පාර්ශවයන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ විධිවිධාන හා සිවිල් නීති රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය.
(ඇ)	**රියැදුරු බලපත්‍ර කාඩ්පත් මිලදී ගැනීම**		
	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව දේශීය සැපයුම්කරුවන්ගේ හැකියාව සීමාවන විට ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීම මගින් ප්‍රසම්පාදනය සිදුකළ යුතු වුවත් ආසන්න වශයෙන් සාමාන්‍ය මාසික අවශ්‍යතාවය කාඩ්පත් 90,000ක හා වාර්ෂික අවශ්‍යතාවය 1,080,000ක් වන රියදුරු බලපත්‍ර කාඩ්පත් අවශ්‍යතාවයෙන් අවම වශයෙන් මාස 06 කට පමණ හෝ ප්‍රමාණවත් නොවන ප්‍රමාණයක් වූ ජාත්‍යන්තර ප්‍රමිතයෙන් යුතු ආරක්ෂිත සලකුණු තත්ත්ව සහතික QR සංකේත සහිත පොලිකාබනේට් කාඩ්පතක් 400,000 මිලදි ගැනීම සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමය භාවිතාකර තිබුණි. ලංසු	මෙම කාඩ්පත් ප්‍රසම්පාදනයට ඉල්ලීම් කළ අංක DMT/WE/DLP/01/COM දරණ කොමසාරිස් (රියදුරු බලපත්)ගේ ලිපියට අනුව 193500 කාඩ්පත් ඉදිරි මාස 03ට ප්‍රමාණවත් ලෙස දන්වා ඇත. ඒ අනුව, මාස 06ක අවශ්‍යතාව මිලදී ගැනීමට ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් තිරණය කළ අතර, රියදුරු බලපත්‍ර ප්‍රසම්පාදනයක් සිදු වූ කාල වකවානුවක් හෝ ඊට අදාළ ලිපි ලේඛන කිසිවක් නොමැතිව නවතම ප්‍රසම්පාදනයක් ලෙස රියදුරු බලපත්‍ර කාඩ්පත් මිලදී ගැනීම සිදුකළ යුතු බැවින්, විශාල ප්‍රමාණයක් එකවර මිලට ගැනීම අවදානම් විය හැකි බැවින්, මාස 06ක ප්‍රමාණය මිලට ගැනීම සිදුකරන ලදී.	වාර්ෂික අවශ්‍යතාවය නිවැරදිව ඇස්තමේන්තු කර ඒ අනුව නිවැරදිව පිරිවැය ඇස්තමේන්තු සකස් කර, නියමිත අධිකාරිය මත ඊට අදාල ප්‍රසම්පාදන ක්‍රමය තීරණය කර ලංසු කැඳවීම මගින් තෝරා ගන්නා යෝග්‍ය සැපයුම්කරුගෙන් එම අවශ්‍යතාවය මිලදී ගැනීමට කටයුතු කළ යුතුය.

	ලේඛණයන්හි අඩංගු කොන්දේසි ප්‍රකාරව කාඩ්පත්වල අන්තර්ගතයන් ස්වාධීන රසායනාගාර පරීක්ෂාවකින් පසුව ඇණවුම් කළයුතු වුවත් එවැනි පරීක්ෂාවකින් තොරව ප්‍රසම්පාදන ඇණවුම මිලදී ගෙන තිබුණි.		
(ඉ)	**වාහන හඳුනාගැනීමේ අංකය සහිත අංක තහඩු සැපයමේ කොන්ත්‍රාත් මිල සංශෝධනය**		
(i)	අන්තර්ජාතික තරගකාරී මිල ගණන් කැඳවීම ක්‍රමයට ලංසු කැඳවා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර ඇති, ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ගිවිසුමක් සඳහා ඩොලරයට ගෙවන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය වෙනස්වීම මත ගිවිසුම්ගත මිල ගණන් සංශෝධනයක් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ තුල ප්‍රතිපාදනයන් ඇතුළත් වී නොතිබියදී ගිවිසුමෙහි මිල සංශෝධනයක් සාධාරණීකරණය කරමින් අමාත්‍ය මණ්ඩලය පත් කල මිල ගණන් සාකච්ඡා කිරීමේ කමිටුවක් (CANC) පත්කර දෙන ලෙසත්, එම කමිටුවට සහාය දැක්වීම සඳහා ව්‍යාපෘති කමිටුවක් පත්කරන ලෙසත්, ගරු ප්‍රවාහන අමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත 2022 අගෝස්තු 02 දින අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමුකර අංක අමප/22/1104/608/010 දරණ 2023 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. සැපයුම මිල ගණන් තීරණය වන අනෙකුත් කිසිදු කරුණක් පිළිබඳ ඇගයීමකින් තොරව විනිමය අනුපාතයේ වෙනස්වීම පමණක් සැලකිල්ලට ගෙන අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ මිල ගණන් සාකච්ඡා කිරීමේ කමිටුව (CANC) සිය කමිටු වාර්තාව පිළියෙල කර තිබූ අතර සැපයුම්කරු සමඟ සාකච්ඡා කර එකඟ වන මිල සංශෝධනයක් ලබා දීමට සුදුසු බව තීරණය කර තිබුණි.	2022 වර්ෂයේ පැවති කෝවිඩ් තත්වය හේතුවෙන් රට තුල පැන නැගුන ආර්ථික අර්බුදය හේතුවෙන් විනිමය අනුපාතිකය ඉහල යාම මත පවත්නා ගිවිසුම්ගත මිලට වාහන අංක තහඩු මුද්‍රණය කිරීම කළ නොහැකි බැවින් එම ගිවිසුමේ අංක 30 කොන්දේසිය ප්‍රකාරව ඩොලරයේ අගය වෙනස්වීමට නම්‍යශීලී වෙමින් ආනයන හා අපනයන පාලකගේ අංක IECD/6/15/002/01/2022 හා 2022.05.12 දිනැති ලිපිය මගින් නිකුත් කර ඇති 05/2022 මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛය හා මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 03/2022 හා 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයට අනුව 79%ක මිල වැඩිවීමක් ඉල්ලා 2022.05.22 හා 2022.06.15 දිනැතිව ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එම ඉල්ලීම පිළිබඳව සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලද 2022.08.02 අමාත්‍ය මණ්ඩල සංදේශයට 2022.08.22 ලද තීරණයට අනුව අමාත්‍ය මණ්ඩලය විසින් තාක්ෂණික ඇගයුම් මණ්ඩලයක් පත් කර ඇති අතර, එම කමිටු වාර්තාව 2022.11.22 දින ඉදිරිපත් කරමින් විදේශ විනිමය අනුපාත ඉහල යාමට සාපේක්ෂව අදාල සැපයුම්කරු සමග සාකච්ඡා කර සුදුසු මිල වැඩිවීමක් ලබා දීමටත් නිර්දේශ කර ඇත.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ඇත්නම් පමණක් ඊට අනුකූල වනසේ මිල ගණන් සංශෝධනය කළ යුතුය.
(ii)	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගිවිසුම් කොන්දේසි අංක 30 අනුකූලව මිල සංශෝධනයක් ලබා දීම සඳහා ගිවිසුමේ නෛතික ප්‍රතිපාදන	මෙම ප්‍රසම්පාදනයට අදාළ සැපයුම්කරු විසින් මිල වැඩි වීමක් ඉල්ලා සිටින්නේ විදේශ විනිමය අනුපාතය ඉහළ යාම පදනම් කරගෙනය. එබැවින් වාහන අංක තහඩු	රජය හා රජයට අනුබද්ධිත ආයතන සඳහා දී ඇති මාර්ගෝපදේශ හා

පවතින්නේද නීතිපති විමසා තිබූ අතර "කිසිදු නෛතික විධිවිධානයක් සඳහන් කිරීමකින් තොරව මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයේ අඩංගු කරුණු, ගිවිසුමේ 30 වගන්තියට ඇතුළත් විෂය පථයට අයත් නොවන බව" නීතිපති විසින් පෙන්වා දී තිබුණි. එහෙත් නීතිපති මතය අදාල කර ගැනීමකින් තොරව හා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව සියයට 62.5ක මිල වැඩිවීමක් ලබාදිය හැකි පරිදි කොන්ත්‍රාත්කරු සමග ඇතිකරගෙන තිබූ ගිවිසුමේ 14 වැනි වගන්තිය වෙනස් කිරීමට කටයුතු කර තිබුණි.	සඳහා වන අමුද්‍රව්‍ය ආනයනය සඳහා විදේශ විනිමය අනුපාත ඉහළ යාම බලපාන බැවින් 79% ක මිල වැඩිවීමක් සැපයුම්කාර ආයතනය විසින් ඉල්ලා ඇත. එදිනට විදේශ විනිමය අනුපාතයේ ඉහළ යාම 2018 වර්ෂයට සාපේක්ෂව 97% කින් ඉහළ ගොස් ඇති බව තාක්ෂණික ඇගයුම් කමිටුව ගණනය කර ඇත. එසේම උද්දමන අනුපාතය හා ඉන්දන මිල ඉහළ යාම පිළිබඳවද නිරීක්ෂණය කර ඇත. ඒ පිළිබඳව අවධානය යොමු කරමින් වාහන අංක තහඩු සඳහා ගෙවන මිලෙහි යම්කිසි වැඩි වීමක් සිදු විය යුතු බව තාක්ෂණික ඇගයුම් කමිටුව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව මිල වැඩි කිරීම සඳහා සැපයුම්කරු සමඟ සාකච්ඡා කර සුදුසු මිලක් තීරණය කිරීමට නිර්දේශ කර ඇත.	භාවිතයන් සැලකිල්ලට ගෙන මෙවනි විශේෂිත අවස්ථාවලදී කටයුතු කළ යුතුය.

(ඊ) වේරහැර කාර්යාලයේ පරිගණක හා උපාංග වෙනුවෙන් වූ සේවා ගිවිසුම්

වේරහැර රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධිත කාඩ්පත් මුද්‍රණ යන්ත්‍ර හා SriTis පරිගණක මෘදුකාංගය හැර අනෙකුත් පරිගණක හා උපාංගයන්, සේවා හා නඩත්තු අවශ්‍යතාවය අනුව ප්‍රධාන වර්ග 12ක් යටතේ හඳුනාගෙන තිබුණි. ඉන් වර්ග 07ක් සඳහා තරහකාරී මිල ගණන් කැඳවා සේවා සැපයුම්කරුවන් තෝරා ගෙන ඇති අතර වර්ග 05ක් වෙනුවෙන් එක් ලංසුකරුවෙකුගෙන් පමණක් ලංසු කැඳවා එකී ලංසුකරුගෙන් සේවා සැපයුම් ලබාගෙන තිබුණි. ඒක පාර්ශවීය ලංසු කැඳ වූ අයිතම වර්ග 05 සම්බන්ධයෙන් තරගකාරී මිල ගණන් මත සේවා සැපයීම් ලබා ගැනීමේ නොහැකියාවට අදාළ කිසිදු ලේඛනයක් තාක්ෂණික ඇගයීම් කමිටු සටහන්වල හෝ ලිපිගොනුවේ ඇතුළත් කිරීමකින් තොරව උක්ත සේවා සැපයුම්, තෝරාගත් එක් සමාගමක් වෙත ලබා දී තිබුණි.	2021 වර්ෂයේ සිට වර්ෂ 03ක් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් සියළු මෙහෙයුම් කටයුතු සිදුකරනු ලැබූ දෙපාර්තමේන්තුවේ රියදුරු බලයත්‍ර නිකුත් කරනු ලබන පරිගණක් පද්ධතිය හා ඊට අනුබද්ධිත සියළුම කටයුතු නැවත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට පවරා ගනු ලැබුවේ 2023 ඔක්තෝම්බර් මාසසේදීය. මෙම පවරාගැනීමේදි මෙම කාර්යය නැවත් දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට ශ්‍රී ලංකා යුධ හමුදාව කිසිදු අනුකූලතාවයක් නොදැක්වූ අතර එම හේතුවෙන් මෙම පවරා ගැනීම දෙපාර්තමේන්තු නිලධාරීන්ට කිසිසේත්ම සුමට කාර්යයක් වූයේ නැත. මෙහිදි දෙපාර්තමේන්තු නිලධාරීන්ට මෙම කාර්යය දැඩි ලෙස අභියෝගාත්මක විය. මෙම තත්ත්වය මත සේවා පවත්වාගෙන යාමේ අවධානම අවම කර ගැනීම සඳහා සේවා ගිවිසුම් අඛණ්ඩව පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර නොයෙකුත් ආකාරයෙන් සොයාගන්නා ලද තොරතුරු මත කලින් පවත්වාගෙන ආ සේවා ගිවිසුම් ඒ ආකාරයට පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී.	මෙම සේවා සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කර නියමිත අධිකාරිය මත ඊට අදාල ප්‍රසම්පාදන ක්‍රමය තීරණය කර ඒ අනුව කැඳවිය යුතු අවම ලංසු ගණන කැඳවා යෝග්‍ය සැපයුම්කරු තෝරා ගත යුතුය.

4.2 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**එක් දින සේවාව යටතේ රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම**		
(i)	වෙරහැර කාර්යාලය මගින් එක් දින සේවාව යටතේ දිනකට රියදුරු බලපත්‍ර 200ක් මුද්‍රණය සඳහා අවස්ථාව ලබා දී ඇත. එහෙත් එම රියැදුරු බලපත්‍ර 200ට අමතරව පූර්වයෙන් සාමාන්‍ය ක්‍රමයට අයදුම් කර රියදුරු බලපත්‍ර ලබාගෙන ඇති පුද්ගලයින් සඳහා එක් දින සේවා ගාස්තුව ගෙවා දිනකට ආසන්න වශයෙන් රියදුරු බලපත්‍ර 300ක් 400ත් අතර ප්‍රමාණයක කාඩ්පත් මුද්‍රණය කිරීමට වෙරහැර කළමනාකරණය කටයුතු කර තිබුණි. මෙම කාඩ්පත් ලබාගැනීම සඳහා අදාළ පුද්ගලයින් ටෝකන් ලබාගෙන නොතිබීම, මුද්‍රණය වී ඇති කාඩ්පත් ලබා ගැනීම සඳහා පුද්ගලයින් පැමිණි බවට තොරතුරු ලේඛනගත වී නොතිබීම හා සාමාන්‍ය ක්‍රමයට රියදුරු බලපත්‍ර ලබාගත් තැනැත්තන්ට වෙරහැර පරිශ්‍රයට පැමිණ එක්දින සේවාව මගින් රියැදුරු බලපත්‍ර කාඩ්පත් ලබාගත හැකි බවට මහජනයා වෙත තොරතුරු සන්නිවේදනය කර නොතිබීම යන කරුණු සැලකිල්ලට ගත්කල පසුගිය මාස 09ක කාලය තුල නිකුත් කළ 61,177ක කාඩ්පත් ප්‍රමාණය අයථා ක්‍රම මගින් ලබාදෙන බවට ලැබෙන මහජන නියෝජන විගණනයේ දී බැහැර කළ නොහැකි විය.	දිනපතා එක් දින සේවය යටතේ (online appointment) අයදුම්කරුවන් 500 කට අයදුම්පත් භාර දීමට අවස්ථාව ලබා දී ඇත. ඊට අමතරව, (a). වෙනත් මාර්ගගත කාර්යාලයකින් සාමාන්‍ය සේවය යටතේ අයදුම් කර වෙරහැර කාර්යාලයට පැමිණ එක් දින සේවය යටතේ රියදුරු බලපත්‍රය ඉල්ලුම් කරන අයදුම්කරුවන් (b). එමෙන්ම එක් දින සේවය සඳහා වේලාව වෙන් කර ගෙන නොමැති නමුත් විදේශ ගතවීම්, රැකියාවන් සඳහා සම්මුඛ පරීක්ෂණ සඳහා යාමට ඇති අවස්ථාවල දී ඊට අදාළ ලේඛන (තහවුරු කිරීම සඳහා) ඉදිරිපත් කරන අවස්ථාවලදීද එක් දින සේවා අවස්ථාව ලබා දේ. (c) එමෙන්ම අත්‍යවශ්‍ය සේවාවල වෛද්‍ය සේවයේ නියුතු පුද්ගලයින්, පොලිස් දෙපාර්තමේන්තුවේ හා ත්‍රිවිධ හමුදා නිලධාරින් හා රජයේ හා පෞද්ගලික ආයතනවල සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටින අයදුම්කරුවන් (අදාළ ලේඛන සමඟ) කරනු ලබන ඉල්ලීම් සළකා බලා එක් දින සේවය සඳහා අවස්ථාව ලබා දීමට කටයුතු කර ඇත.	සාමාන්‍ය ක්‍රමයට ලබාගත් රියදුරු බලපත්‍රවලින් එක්දින ගාස්තු ගෙවීමකින් තොරව හදිසි අවශ්‍යතාවයන් ලෙස සලකා රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමට සිදුවන අවස්ථාවන් සඳහා පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ ඒ අනුව එම හදිසි අවශ්‍යතාවයන් සඳහා අදාල ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමේ සාධාරණ බව සලකා බලා බලයලත් නිලධාරියෙකු විසින් දෙනු ලබන අනුමැතිය ලේඛනගත කර පවත්වා ගෙන යා යුතුය.
(ii)	පසුබැසි තොගයේ ඇතුළත් සාමාන්‍ය ක්‍රමයට ලබාගත් රියදුරු බලපත්‍රවලින් දිනකට 200ත් 250ත් අතර ප්‍රමාණයක් එක්දින ගාස්තු ගෙවීමකින් තොරව කොමසාරිස් (රියදුරු බලපත්‍ර) හා නියෝජ්‍ය කොමසාරිස්වරුන් විසින් හදිසි අවශ්‍යතාවයන් ලෙස සලකා මුද්‍රණය කර දෙන ලෙස මුද්‍රණ අංශය වෙත නියෝග ලබා දී තිබුණි. 2023 වර්ෂයේ දෙසැම්බර් සිට 2024 අගෝස්තු දක්වා රියදුරු බලපත්‍ර 21,890ක් මෙලෙස මුද්‍රණය කර තිබුණි. උක්ත අනුමැතිය ලබාදීම සඳහා පාදක වූ	එසේම සාමාන්‍ය සේවය යටතේ රියදුරු බලපත් කාර්යයන් සඳහා අයදුම් කර ඇති එහෙත් රියදුරු බලපත්‍රය මුද්‍රණය වී නොමැති නමුත් අයදුම්පත බලාත්මක වී ඇති අවස්ථාවන්හිද අයදුම්කරුවන්ගේ ඉල්ලීම් මත රියදුරු බලපත් කාඩ්පත් මුද්‍රණය කර දෙනු ලැබේ. එය හදිසි මුද්‍රණ ලෙස නිකුත් කෙරේ.ඒ සඳහාද ඉල්ලීම තහවුරු කිරීම සඳහා අදාළ ලේඛන හා මාණ්ඩලික නිලධාරියෙකුගේ හෝ අධීක්ෂණ නිලධාරීගේ අනුමැතිය අවශ්‍යවේ. මෙහිදීද අදාළ සියලු ලේඛන පරිගණකගතව පරිලෝකනය කරනු ලැබේ.	සාමාන්‍ය ක්‍රමයට ලබාගත් රියදුරු බලපත්‍රවලින් එක්දින ගාස්තු ගෙවීමකින් තොරව හදිසි අවශ්‍යතාවයන් ලෙස සලකා රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමට සිදුවන අවස්ථාවන් සඳහා පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සහ ඒ අනුව එම හදිසි

	හේතූන් ලේඛනගත වී නොමැති අතර, ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.	එමෙන්ම 2024 ජූලි මස සිට විගණනයෙන් පෙන්වා දුන් පරිදි පරිගණකගතව ස්කෑන් කිරීමට අමතරව අදාළ තොරතුරු ලේඛනයක් ලෙසද පවත්වා ගෙන යනු ලැබේ.	අවශ්‍යතාවයන් සඳහා අදාල ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමේ සාධාරණ බව සලකා බලා බලයලත් නිලධාරියෙකු විසින් දෙනු ලබන අනුමැතිය ලේඛනගත කර පවත්වා ගෙන යා යුතුය.
(ආ)	**ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍ර නිකුත් කිරීම**		
(i)	2009 අංක 08 දරණ මෝටර් වාහන (සංශෝධන) පනතේ 34 ඡේදය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තියට සිදුකර ඇති සංශෝධනය වන 132 (අ) II අනුව ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් නිකුත් කිරීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා පත් කරනු ලබන බලයලත් නිලධාරියෙකු විසින් ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙකුම පරීක්ෂා කළ යුතු බව දක්වා ඇති නමුත්, රියදුරු කාර්යය සඳහා අත්‍යාවශ්‍ය වන අයදුම්කරුවන්ගේ භෞතික ශරීර අවයව නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න හෝ පරීක්ෂාවකින් තොරව අයදුම්කරු රහිතව අදාල සංගමය විසින් ඉදිරිපත් කරන අයදුම්පත් සඳහා ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍ර ලබා දී තිබුණි.	2009 අංක 8 දරන මෝටර් රථ වාහන (සංශෝධන) පනතට අනුව ලංකාවේ ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රය නිකුත් කිරීමේ බලය ඇත්තේ ලංකා ඔටෝමොබයිල් සංගමය වෙතය. පූර්ව මුද්‍රිත අංක සහිත ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍ර ආකෘති නිකුත් කරනු ලබන්නේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයෙනි. විධිමත් හා නිසි පරිදි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ඉදිරියට වසර 1 කට වඩා කාලයක් වලංගු වන රියදුරු බලපත්‍රයක් ඇති පුද්ගලයින් සඳහා ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබේ.	කොමසාරිස් ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා පත් කරනු ලබන බලයලත් නිලධාරියෙකු විසින් ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙකුම පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.
(ii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2301/17 හා 2022/10/10 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෝටර් වාහන පනතේ 203 අධිකාරිය සඳහා වූ නියෝග අනුව ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් නිකුත් කිරීමේ සාමාන්‍ය සේවා ගාස්තුව රු.3,000ක් හා එක්දින සේවා ගාස්තුව රු.3,500ක් වන අතර, එකී ගාස්තු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් අය කළ යුතු වේ. එහෙත් එකී නියෝගයන්ට පටහැනිව එක් ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක්	ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් නිකුත්වීමට අදාළව සාමාන්‍ය සේවය යටතේ රු.3,000 ක්ද එක්දින සේවය යටතේ රු.3,500 ක්ද ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2301/17 හා 2022.10.10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව අය කර ගැනීම සිදු වේ. එක් එක් දිනවල දී අත්සන් කරනු ලබන යදුම්පත් සංඛ්‍යාවට අදාළව කරනු ලබන ගෙවීම් චෙක්පතක් මඟින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත දිනපතා ලංකා ඔටෝමොබයිල් සංගමය විසින් ලබා දේ. ඒ අනුව රජයට අයවිය යුතු ගාස්තුව	රජයේ අනුමත ගාස්තුවලින් තොර ගාස්තු අයකිරීම වැළැක්වීමටත්, නෛතික බලයක් නොමැති ආයතන මහජන මුදල් අය කිරීම වැළැක්වීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

	වෙනුවෙන් රු.10,394ක මුදලක් අදාල සංගමය විසින් අයකර ගෙන තිබුණි. මෙය පෞද්ගලික ආයතනයක් බැවින්, ඔවුන් අය කරනු ලබන අනෙකුත් ගාස්තු සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වගකීමට නොබැඳෙන බව විගණනය වෙත දැනුවත් කර ඇත.	නීත්‍යානුකූලව අය කර ගෙන ඇත.	
(iii)	මෝටර් වාහන පනතේ 132(ආ) වගන්තිය අනුව වියානා සම්මුතියේ ගිවිසුම් රාජ්‍යවලින් නිකුත් කරන ලද වලංගු ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද රියදුරු අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුවේ. ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍රයක් හිමි තැනැත්තෙකුට මෝටර් වාහන පනත ප්‍රකාරව කිසිදු බාධාවකින් තොරව ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී පංතියට අදාළ මෝටර් වාහන පැදවිය හැකි වේ. එහෙත් අදාල සංගමය කිසිදු නෛතික පදනමකින් හෝ බලයකින් තොරව ශ්‍රී ලංකාවට පැමිණෙන ජාත්‍යන්තර රියදුරු අවසර පත්‍ර හිමි ආගන්තුකයන්ගෙන් රු.8,466ක මුදලක් අයකර Recognition permit නමින් අනීතික රියදුරු අවසර පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. Recognition permit නිකුත් කිරීම සඳහා මෝටර් වාහන පනතෙහි හෝ වෙනත් කිසිදු ආකාරයක නිතිමය ප්‍රතිපාදනයක් නොමැති බව අවස්ථා දෙකකදී අදාල සංගමය දැනුවත් කර ඇති බව මෝටර් රථ ප්රවාහන කොමසාරිස් ජනරාල් විසින් විගණනය වෙත දැනුවත් කර ඇත.	Recognition permits නිකුත් කිරීම සඳහා මෝටර් වාහන පනතෙහි හෝ වෙනත් කිසිදු ආකාරයක නිතිමය ප්‍රතිපාදනයක් නොමැත. මේ සම්බන්ධයෙන් අවස්ථා දෙකකදි ලංකා ඔටොමොබයිල් සංගමය දැනුවත් කර ඇත.	අනීතික රියදුරු අවසර පත්‍රයක් නිකුත් කිරීම වැළැක්වීමටත්, පනතේ බලය අවභාවිත කළ තැනැත්තන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	**රියැදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා ලිඛිත විභාග පැවැත්වීම**		
(i)	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වේරහැර කාර්යාලය මගින් රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ලිඛිත පරීක්ෂණයන් පූර්ව දින වෙන් කර ගැනීම යටතේ පරිගණක භාවිතයෙන් දිනකට අවස්ථා 03ක දී සිදු කරනු ලබන අතර ඒ සඳහා පරිගණක යන්ත්‍ර 143ක් භාවිතා කරනු ලබයි. ඒ අනුව එක් අවස්ථාවක දී යාන්ත්‍රික	රියදුරු බලපත්‍ර ලිඛිත විභාගය සඳහා එක් දිනයකදී එක් විභාග වාරයකට අයදුම්කරුවන් 143 කට පෙනී සිටීමේ අවස්ථාව ඇති අතර ඇතැම් දිනවලදී පරිගණක අක්‍රිය වීම හේතුවෙන් එම සංඛ්‍යාව ඉතාම සුළු ප්‍රමාණයකින් වෙනස් විය හැකිය. 2022.10.10 දිනැති අංක 2301/17 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි රියදුරු බලපත්‍ර සඳහා වන	නිලධාරීන්ට තම අභිමතය පරිදි පුද්ගලයන් විශේෂ කොට අවස්ථා ලබාදිය හැකි පරිදි ස්ථාපිතව ඇති පද්ධති දුර්වලතා කඩිනමින් නිවැරදි කර මානව හිමිකම්

	දෝෂයන්ට අවස්ථාව සලසා දෙමින් අයදුම්කරුවන් 135ත් 140ත් අතර සංඛ්‍යාවකට විභාගයට මුහුණ දීමේ අවස්ථාව ලබාදිය හැකි වුවත්, එක් අවස්ථාවක දී විභාගයට අයදුම් කළ හැකි අයදුම්කරුවන් ගණන 110කට සීමා කර තිබුණි. එහෙත් විභාගය පැවැත්වෙන දිනයේ දී හෝ ඊට පෙර දින විශේෂිත මුර පද හිමි නිලධාරීන් විසින් ඉතිරි ආසන (පරිගණක) සඳහා අවිධිමත් ලෙස අයදුම්කරුවන් යොමු කර තිබුණි.	සංශෝධිත ගාස්තු ලේඛනයට අනුව හා 2024.11.26 දිනැති අංක 08/2024 දරණ මෙම දෙපාර්තමේන්තු අභ්‍යන්තර චක්‍රලේඛනයට අනුව රියදුරු බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ලියාපදිංචි වන අයදුම්කරුවන්ට ලිඛිත විභාගය සඳහා රු.1,000 ක අමතර රජයේ ගාස්තුවක් ගෙවා එදිනම ලිඛිත විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබා දී ඇත.	සුරැකීමට කටයුතු කිරීම.
(ii)	රියැදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණය සඳහා ඕනෑම දිනකට අයදුම්කරුවන් යොමු කළ හැකි මෙන්ම රඳවා තබාගෙන ඇති ආසන සඳහා අයදුම්කරුවන් යොමු කළ හැකි වන පරිදි වේරහැර කාර්යාලයෙහි නිලධාරීන් 15 දෙනෙකු වෙනුවෙන් සුවිශේෂී මුරපද ලබා දී ඇති අතර, මාණ්ඩලික නොවන නිලධාරීන් 11 දෙනෙකු ද ඊට ඇතුළත් වී තිබුණි.	මෙම කාර්යාලයේ රාජකාරි කරනු ලබන නිලධාරීන් අතරින් විශේෂිත මුරපද ලබා දී ඇත්තේ පහත සඳහන් නිලධාරීන් සඳහා පමණි. එනම් 1.කොමසාරිස් /නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස් 2.රාජකාරි අවශ්‍යතාවය අනුව එක් එක් අංශවල වගකිව යුතු නිලධාරීන් ඒ අනුව ලිඛිත විභාගය සඳහා දින ලබා දීම සිදු කරනුයේ මුදල් අය කර ගන්නා කවුළුවල රාජකාරි කරනු ලබන නිලධාරීන් පමණි.	සුවිශේෂී මුරපද ඉවත් කර ඉහත (i) හි පරිදි පද්ධතිය සංවර්ධනය කිරීම.
(ඇ)	**ලියාපදිංචි අංක KE - XXXX දරන මෝටර් රථයට අදාළව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියේ ඇතුළත් දත්ත වෙනස් කිරීම**		
	උක්ත ලියාපදිංචි අංකය දරන AT-212-0066488 වැසි අංක සහිත මෝටර් රථය 2007 අගෝස්තු 15 දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අංක LOT S 0034392 දරන ලියාපදිංචි සහතිකය යටතේ ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ 01 නමින් ලියාපදිංචි වී තිබුණි. එකී ලියාපදිංචි අංකය යටතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය තුළ ඇතුළත්ව තිබූ වාහනයේ හිමිකරුගේ නම, හිමිකරුගේ ලිපිනය, වැසි අංකය, එන්ජින් අංකය ඇතුළු ප්‍රධාන ලියාපදිංචි දත්තයන් වංචනික ලෙස වෙනස් කර, ඒ වෙනුවට අංක LOT S 0034392 දරන එම ලියාපදිංචි සහතිකය යටතේම ගාල්ල ප්‍රදේශයේ පුද්ගලයෙකුගේ තොරතුරු මෝටර් රථ ප්‍රවාහන දත්ත	ඉහත කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද විගණන විමසුම සඳහා 2025.03.19 දින දෙන ලද පිළිතුරේ සඳහන් පරිදි මේ සම්බන්ධව කඩිනමින් විමර්ශණයක් සිදුකර වාර්තාවක් සැපයීම සඳහා 2025.05.08 දින මා විසින් කමිටුවක් පත්කරන ලදි. එම විමර්ෂණ කමිටු වාර්තාව 2025.06.08 දිනට පෙර ලබාදීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. විමර්ෂණ කමිටු වාර්තාව ලද පසු ඉහත අංක වාහනය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.	මෙම දත්ත වෙනස් කිරීම සිදු කර ඇති මුරපදය හිමි නිලධාරියා හඳුනාගෙන කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

පද්ධතියට ඇතුළත් කරමින්, ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් උක්ත වාහනයේ තොරතුරු දත්ත පද්ධතියෙන් වංචනිකව මකා දමා තිබුණි.